# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය


## METH SAVIYA NEWS LETTER


සාමාජිකයන් සඳහා තොරතුරු පත්‍රිකාව * 2012 අගෝස්තු * මෙත්සවිය නමවන කාණ්ඩය *18 වන කලාපය












ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ 06. 071 4014467 / 011 2505088
www.methsaviya.org www.methsaviya.lk,

## 2012 ජනවාරි 01 - වසරේ ප්‍රථම හීල් දානමය පුණ්‍ය කර්මය කොළඹ 02 හුණුපිටිය ගංගාරාම විහාරයේදී පැවැත්විය.



# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, පෙඩ්‍රිකා පාර, කොළඹ - 06.


## අප ගැන වචනයක්...

මෙත්සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රීලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. සංසදය විසින් පවත්වන සාර්ථකව ඉගෙන ගන්නා අයුරු හා විභාග සමත්වන අයුරු, කාල කළමනාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනාව වැනි වැඩසටහන් සඳහා සහභාගීවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීමට තෙමසකට වරක් දාන-සීල භාවනා වැඩසටහන් පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙරපානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම, මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

### මෙත්සවිය විධායක කමිටුව

**2011**

**ගරු අනුශාසක**
ශ්‍රී විනයචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත
වංසාලංකාර අමරපුර නිකායේ
අධිකරණ සංඝනායක
අතිපූජ්‍ය අහංගම ආනන්ද
මහා ස්ථවිරයන් වහන්සේ

**ගරු සභාපති**
විද්‍යා කීර්ති, ශාසනදීපන,
ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති, දේශමාන්‍ය,
විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී,
නාලන්දා කීර්ති ශ්‍රී
මහාචාර්ය චන්දන ජයරත්න මහතා

**ගරු උප සභාපතිවරු**
සරත් ඉලංගතිලක මහතා
නිහාල් මෙන්ඩිස් මහතා

**ගරු සම ලේකම්වරු**
තුසිත දොඹගොඩ මහතා
පී. සූරියආරච්චි මහතා

**ගරු භාණ්ඩාගාරික**
වාසනා රණසිංහ මහතා

**ගරු උප භාණ්ඩාගාරික**
ජනක සුවඳරත්න මහතා

**ගරු සංස්කාරක**
එස්. කේ. කළුබෝවිල මහතා

**ගරු වෙබ් කළමනාකරු**
සංජීව රත්නායක මහතා

**ගරු කාරක සභිකවරු**
නාලක එදිරිසිංහ මහතා
රංජිත් සොයිසා මහතා
එස්. පී. පියරත්න මහතා
එම්.කේ. ප්‍රියන්ත මහතා
අසංක රත්නායක මහතා
සහන් මොරවක මහතා

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු
## සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

**2012 සැප්තැම්බර් 02 - ත්‍රෛමාසික දාන ශීල භාවනා වැඩසටහන අම්බලන්ගොඩ ගල්දුව ආරණ්‍ය සේනාසනයේදී පැවැත්වේ.**

2012 සැප්තැම්බර්02 දින පෙ.ව. 06.00ට වැල්ලවත්ත විජයාරාමයෙන් සහ බොරැල්ල ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයෙන් බස් රථ පිටත්වේ. බස් රථ වල යාමට බලාපොරොත්තු වන සාමාජිකයින් හා ඔවුන්ගේ පවුලේ අය සඳහා කාර්යාලයට එක් අයෙකුට රු.600/= බැගින් මුදල් ගෙවා අගෝස්තු 27ට පෙර ආසන වෙන් කර ගන්න. පෙ.ව. 09.00ට පෙර ගල්දුව ආරණ්‍ය සේනාසනයට යායුතු නිසා ඉහත දක්වා ඇති වේලාවටම බස්රථ පිටත්වන බැවින් ඊට පෙර පැමිණෙන ලෙස සහභාගි වන සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මෙයට සහභාගි වන සාමාජිකයන් සහ තම පවුලේ සාමාජිකයන් සිල් සමාදන් වීමට සුදුසු සුදු ඇඳුමකින් සැරසී පැමිණිය යුතුය. මෙදින හීල් දානය සහ දවල් දානය සඳහා තමන් පලතුරු පමණක් ගෙනා යුතු අතර වෙනත් අයෙකුටද දීමට සෑහෙන සේ ගෙන එන්නේ නම් මැනවි. පානය සඳහා කුඩා වතුර බෝතලයක්, කෝප්පයක්, රැගෙන එන්න. ඉඳගෙන භාවනා කිරීම සඳහා පත්කඩයක්, කුෂන් එකක් හෝ කුඩා කොට්ටයක් වැනි යමක් ගෙන ආවාට කම් නැත. පොලිතින් භාවිතා නොකල යුතුය.

මෙම ආරණ්‍ය සේනාසනයේ භික්ෂූන් වහන්සේලා 60 නමක් වෙසෙන අතර උන් වහන්සේලාට එදින දහවල් දානය සඳහා කැමති අයට පලතුරු පූජා කිරීමට හැකි බව නායක හිමිපාණන් දන්වා ඇත.

මෙම ආරණ්‍ය සේනාසනයේ අවශ්‍යතාවක්ව ඇති බුදු මැදුර ටයිල් ඇල්ලීමට මෙත්සවිය බලාපොරොත්තුවේ. ටයිල් ඇල්ලීම ට යන වියදම වෙනුවෙන් එදිනට ඔබට හැකි පමණින් දායක විය හැකිය. මෙම ආරණ්‍ය සේනාසනයට වෙනත් අවශ්‍යතාවන් නැති බව සේනාසනයේ නායක හිමිපාණන් දන්වා ඇතත් සේනාසනයේ භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය විය හැකි පිරිකර ද්‍රව්‍ය ගෙනවිත් පූජාකල හැකිය.

තමන් ගේ පුද්ගලික වාහන වලින් පැමිණෙන සාමාජිකයන්ට අම්බලන්ගොඩ නගරයට පැමිණ ගාල්ල දෙසට කිලෝ මීටරයක් පමණ යන විට ගල්දුව ආරණ්‍ය සේනාසනය සටහන්කල පුවරුවක් හමුවේ. එතැනින් වමට හැරී කිලෝ මීටරයක් පමණ යන විට ගල්දුව ආරණ්‍ය සේනාසනය හමුවේ.

**රිජ්වේ ආර්යා ළමා රෝහලට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැප්තැම්බර් 08 සෙනසුරාදා දින සපයා බාර දීමට නියමිතය.** ඒ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඔබට හැකි පමණින් දායක විය හැකිය. මේ සඳහා දායක වීමට බලාපොරොත්තු වන සාමාජිකයින් 2012.09.02 දිනට ප්‍රථම මුදල් කාර්යාලයටලබා දෙන්න.

**25 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන 2012 සැප්තැම්බර් 23 දින ආරම්භ කිරීමට නියමිතය.** ඒ සඳහා ඉල්ලුම් පත් බාරගැනීමේ අවසාන දිනය සැප්තැම්බර් 10. මේ සඳහා සහභාගි වීමට බලාපොරොත්තු වන සාමාජිකත්වය අලුත් කරගත් පැරණි සාමාජිකයින්ට 2012.09.16 දිනට ප්‍රථම ඒ බව කාර්යාලයට ලිඛිතව දන්වන්න. මේ සඳහා සහභාගි වීමට බලාපොරොත්තු වන 24 කණ්ඩායමේ සාමාජිකයින්ට 2012.09.16 දිනට ප්‍රථම කාර්යාලයේ ඇති දෙවන වරට සහභාගි වීම පොතෙහි සාමාජික අංකය සටහන් කරන්න.

**2012 ඔක්තෝබර් 07 - මාසික පලමු ඉරු දින ධර්ම දේශනාව** 2012-09-07 ඉරිදා ප.ව.1:00 සිට ප.ව.5:00 දක්වා කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේදී පැවැත්වේ. මෙදින ඉතා දුර්ලභ අරිය ධම්ම සූත්‍ර දේශනාව ඔබට සවනය කල හැකිය.

## 2012 සැප්තැම්බර් 02 - ත්‍රෛමාසික දාන ශීල භාවනා වැඩසටහන අම්බලන්ගොඩ ගල්දුව ආරණ්‍ය සේනාසනයේදී

201

පෙ.ව. 6.00 වැල්ලවත්ත විජයාරාමයෙන් / බොරැල්ල ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයෙන් පිටත්වීම.

පෙ.ව. 8.30 ගල්දුව ආරණ්‍ය සේනාසනයට පැමිණීම.

පෙ.ව. 8.30 - 8.45 සිල් සමාදන්වීම.

පෙ.ව. 8.45 - 9.15 60 නමක්වූ භාවනානුයෝගී මහා සංඝරත්නය විෂයෙහි දානය පිළිගැන්වීම.

පෙ.ව. 9.15 - 10.00 උදය ගිලන්පස

පෙ.ව. 10.00 - 11.30 භාවනාව

පෙ.ව. 11.30 - 12.30 දහවල් දානය (පලතුරු පමණි)

ප.ව.12.30 - 1.15 භාවනාව

ප.ව.1.15 - 2.45 ධර්ම දේශනාව සහ ධර්ම සාකච්ඡාව

ප.ව.2.45 - 3.00 සවස ගිලන්පස

ප.ව.3.00 පිටත්වීම.

කාලගුණය සුදුසු වේ නම් ලී කැටයම් සහිත පන්සලනැරඹීමට බලාපොරොත්තුවේ

## මාසික පළමු ඉරු දින රැස්වීම

සෑම මසකම පළමුවෙනි ඉරු දින සිරිත් පරිදි (දාන සීල භාවනා වැඩ සටහන් සඳහා සදහම් චාරිකාවේ නොයෙදෙන දිනවලදී) මාසික රැස්වීම් සහ විශේෂ දේශනය ප.ව. 2:00 - 4:00 දක්වා කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේදී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුනද නොලැබුනද සෑම මසකම පළමුවෙනි ඉරු දින (සදහම් චාරිකාවේ යෙදෙන දිනවලදී හැර) මාසික රැස්වීම සඳහා ප.ව. 2:00ට පෙර පැමිණෙන ලෙස සියලු සාමාජික සාමාජිකාවන්ගෙන් මෙත් සිත්පෙරදැරිව ඉල්ලා සිටින්නෙමු. ඉදිරි වැඩ සටහන් පිළිබඳ විස්තර www.methsaviya.lk වෙබ් අඩවියෙන්ද දැන ගත හැකිය. මෙම වැඩ සටහනට දිවයිනේ සුපතල ධර්ම දේශක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වැඩම කරවීම හෝ පෞරුෂ වර්ධනය, යෝග ආදි විශේෂිත කරුණක් හඳුන්වාදීම සඳහා ගිහි භවතකු හට හෝ ආරාධනා කරනු ලැබේ. මේ සඳහා සාමාජිකයින් යෝජනා වෙතොත් සභාපති /ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## මාසික පළමු ඉරු දින රැස්වීම බරපැන දායකත්වය

මාසික පළමු ඉරු දින රැස්වීම වෙනුවෙන් බරපැන සඳහා හෝ දායක වීමට කැමති සාමාජිකයින් වෙතොත් සභාපති /ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## සාමාජිකත්වය අලුත් කිරීම

සාමාජික පත්‍රයේ සඳහන් සාමාජිකත්වය වලංගු සීමාවේ දිනයට පෙර සාමාජිකත්වය අලුත් කරගැනීමෙන් මෙත්සවිය සවිමත් කර ඉදිරි පුණ්‍ය කටයුතු කරගෙන යාමට දායක වන ලෙස මෙත් සිත් පෙරදැරිව මතක් කරමු. ඒ සඳහා කාර්යාලයට පැමිණීම අත්‍යවශ්‍ය නොවේ. ගෙවිය යුතු රු.500/= සාමාජික ගාස්තුව "මෙත්සවිය" නමට ලියා රේඛනය කල චෙක්පතක් හෝ ගෙවන කාර්යාලය, "වැල්ලවත්ත" ලෙස සටහන් කල "මෙත්සවිය"නමට සාමාන්‍ය මුදල් ඇණවුමක් තම ලිපිනය ලියූ රු.30/=ක මුද්දරකවරයක් හා පැරණි සාමාජිකපතද ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, පෙඩ්‍රිකා පාර, කොළඹ06. ලිපිනයට එවීමෙන් අලුත් සාමාජිකපත ලියාපදිංචි තැපෑලෙන් ලබාගත හැකි බව කාරුණිකව දන්වමු.

## සංසදයේ ලිපි යැවීම සඳහා මුද්දර පරිත්‍යාග

සංසදයේ ලිපි යැවීම සඳහා මුද්දර ගාස්තු ලෙස විශාල මුදලක් වැය කිරීමට සිදුවී ඇත. මෙම සත්කාර්යය සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන්ට රු.10 හෝ ඊට වැඩි අගයක මුද්දර කැමති ප්‍රමාණයක් පරිත්‍යාග කල හැකිය. ලබා දෙන මුද්දර ඒ සඳහා ඇති ලේඛනයේ සටහන් කරනු ලැබේ. මෙත් සවිය සංසදයේ පැවැත්මට හා එහි වර්ධනය සඳහා ඔබ ගේ ශාසනාලයැති දායකත්ව අගය කරන්නෙමු.

## මෙත් සවිය ප්ලාස්ටික් හැඳුනුම්පත

ඡායාරූපවලට පෙනී සිට හැඳුනුම්පත ලබා නොගත් වලංගු සාමාජිකත්වය ඇති සාමාජිකයින්ට ඒවා කාර්යාලයෙන් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

## මෙත් සවිය නොමිලයේ නීති උපදෙස් සේවය

සාමාජිකයින් සඳහා අවශ්‍ය නීති උපදෙස් කෙටි වශයෙන් දුරකතනයෙන් හෝ මසකට වරක් හමුවී හෝ ලබා දීමට කැමති සාමාජික නීතිඥ මහත්ම මහත්මීන් වෙතොත් සභාපති / ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## සාමාජිකයින් හා සාමාජිකයන්ගේ පවුලේ අය සඳහා නොමිලයේ ඇස් පරීක්ෂාව හා ඇස් කන්නාඩි ලබාදීම

ඉදිරියේදී පැවැත්වීමට නියමිත මෙම වැඩ සටහන සඳහා ඇස් කන්නාඩි / රාමු කිහිපයක් හෝ ලබාදී දායක වීමට කැමති පිංවතුන් වෙතොත් සභාපති /ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## පූජා භූමිවල පානීය ජල ටැංකි සවි කිරීම / පැන් පහසුකම් තැනීමේ ව්‍යාපාතිය

පූජනීය සිද්ධස්ථානවල ජල ටැංකි / ජල නල/කරාම, සවිකර දීමේ සත් කාර්යයක් අරඹා ඇත. ඔබගේ නමද සටහන්ව මෙම ජල ටැංකි අනුරාධපුරය වැනි ස්ථානවල පමණක් නොව අවශ්‍ය වෙනත් සිද්ධස්ථානවල පවා තනා එම ස්ථානවලට එන පිංවතුන්ගේ පවස නිවීමට කැමති සාමාජිකයින් වෙතොත් කැමත්ත සභාපති /ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න. අවශ්‍ය විටදී ඔබව අමතන්නෙමු. මේ සඳහා රු10,000/=- 40,000/= දක්වා (ස්ථානය අනුව වෙනස් වේ.) වියදමක් දැරීමට සිදුවිය හැකිය. තනිව හෝ කිහිපදෙනෙකු එක්වද මේ සඳහා දායක විය හැකිය. පැන් පහසුකම් අවශ්‍ය සුදුසු සිද්ධස්ථාන වෙතොත් අප වෙත දන්වන්න.

# 2600 සම්මා සම්බුද්ධත්ව ජයන්තිය සමරනු වස් මෙත් සවිය ප්‍රධාන වැඩසටහන ලෙස බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදුවූ මහියංගනය පුණ්‍ය භූමියේ කරනු ලබන පිංකම් මාලාව



අප ගෞතම බුදුරජාණන්වහන්සේ දැනට වසර 2600කට පෙර එනම් බුද්ධත්වයෙන් නව මසක් ඇවෑමෙන් වූ දුරුතු පුන්පොහෝ දින ශ්‍රී ලංකාවට වැඩමකර පළමුවරට ශ්‍රී පාද පද්ම ස්පර්ශයෙන් පවිත්‍ර කල, මහියංගනයේ යක්ෂ ගෝත්‍රිකයන් දමනය කර දහම් දෙසූ ස්ථානය වන, බුදුරජාණන් වහන්සේගේ කේෂ ධාතූන් වහන්සේලා නිදන් කර මහියංගන චෛත්‍යය ඉදිකර ඇති පින්බිමෙහි සම්මා සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් මෙත් සවිය මගින් කලක් පවත්නා විශේෂ අරමුණු කිහිපයක් ඉටු කරන්නට අපේක්ෂා කර ඇත.

1. මහියංගනය වැඳ පුදා ගැනීමට එන ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් සඳහා වන පානීය ජලය සැපයීමේ ව්‍යාපෘතිය -රු. 400,000 වැඩි වියදමක් දරා දැනටමත් නිම කර ඇත.

2. අඩි 84ක් උස බුදු පිළිමය තැනීම- මූලික ගවේශන/පාංශු පරීක්ෂණ කටයුතු නිමකර 2012 ජනවාරි 08 දුරුතු පොහොය දින පෙ.ව. 9:00ට මහියංගන පින්බිමෙහි මෙත්සවිය තනවන අඩි 84ක් උස බුදු පිළිමය සඳහා සුභ මොහොතින් මංගල පස් පිඩ කපා මෙම බුදු පිළිමයේ ආකෘතියක් පෙරහරින් වැඩමවා බුදු පිළිමය තනවන ස්ථානයේ පිහිටුවා ඉදි කිරීමේ ආරම්භය සනිටුහන් කර ඇත.

**මේ සඳහා රු. 3,200,000 ආධාර දැනටමත් ලැබී ඇත. අටමහා කුසලයක් වන මෙයට ඔබ සැමගේ දායකත්වය හැකි අයුරින් ලබාදී මොක් සුව ලඟා කරගන්න.**

**ඔබගේ ආධාර**

බැංකුව : **සම්පත් බැංකුව කිරිබත්ගොඩ ශාඛාව**

ජංගම ගිණුමේ නම: **2600 සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා අරමුදල**

ගිණුම් අංකය: **0005 6000 1118** බැර කරන්න.

**ඕනෑම සම්පත් බැංකු ශාඛාවකදී ඉහත ගිණුමට මුදලින් ගෙවිය හැකිය. නැතහොත් ඉහත ගිණුමේ නමට ලියූ ඕනෑම බැංකුවක චෙක්පතක් මෙත් සවිය කාර්යාලයට තැපැල් කරන්න.**

**මෙත් සවිය කාර්යාලයට මුදලින් ගෙවා ලදුපතක් ලබා ගන්න.**

ලිපිනය: **ලේකම්, මෙත් සවිය, ශ්‍රී විජයාරාමය, පෙද්‍රිකා පාර, වැල්ලවත්ත, කොළඹ 06.**

දුරකතන: 071 401 4467, 011-250 5088.

වැඩි විස්තර සඳහා

071 445 4411 ( දොඹගොඩ මහතා ) , 071-277 4727 ( සූරිය ආරච්චි මහතා ) අමතන්න

සෑම ආධාරයකක් සඳහාම මුදල් ලැබුන බවට ලදු පතක් නිකුත් කරනු ලැබේ.

රුපියල් 1000/=ට වැඩි ආධාර සඳහා රාමුකර තබා ගත හැකි ලදු පතක් නිකුත් කරනු ලැබේ.

රුපියල් 100,000/=ට වැඩි ආධාර සඳහා ඉහත ලදුපතට අමතරව බුදු පිළිමය අසල ශිලාමය පලකයේ නම සටහන් කරනු අත.

ආධාර කල සියලු භවතුන්ගේ නම් (www.methsaviya.lk) වෙබ් අඩවියට සති දෙකක් තුල ඇතුලු කරනු ලැබේ. ( වෙබ් අඩවියට පිවිස 2600 සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමාව ගොඩ නැගීම යටතේ විශේෂ තතු පිටුව බලන්න.)

## සසල මනසට මෙත්සවිය

1. වඩන්නට නිති
සමථ විදසුන්
සසර තරණය
කෙටි කරන්නට

2. පසක් විය මට
පහසු නැති බව
සසල මනසට
එය වඩන්නට

3. කරන්නට මෙත්
සියලු සතහට
මටද මා වැඩූ
මව්පියන් හට

4. ලබන්නට එන
භවය තුලදී
සුගතියක් මා
පැතුම විලසට

5. අප්‍රමාදය
විනා වෙන යම්
මහක් නැත හිමි
දෙසූ විලසට

6. දහම් නදියේ
එතෙර
පෙන්වන
පාලමක් විය

කමලා මැණිකේ තිලකරත්න
මෙත්සවිය සාමාජික අංක 24/3695

## විදේශ බෞද්ධ වන්දනා චාරිකා

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ආරියපාල පෙරේරා මහතාගේ මගපෙන්වීම යටතේ මෙත්සවිය සාමාජිකයින් සඳහා වන පහත වන්දනා චාරිකා සඳහා සහභාගී වීමට කැමති පින්වතුන් හා පවුල්වල අය කාර්යාලයට තම කැමැත්ත ප්‍රකාශ කරන්න. සහභාගිත්වය පිළිබඳ තීරණය අප වෙත ලැබෙන විමසුම් ප්‍රමාණය මත සිදුකරන්නෙමු.

බුරුම දේශය -රු. 165,000.00

වියට්නාම් දේශය රු. 140,000.00

සියළුම චාරිකා දෙසැම්බර්- අප්‍රේල් මාසවල මුල් දිනයන් හි පාසල් නිවාඩු කාල වලදී යොදා ගැනීමට අදහස් කර ඇත.

### මාසික පළමු ඉරු දින ධර්ම දේශනාව /හෝ විශේෂ දේශනය වෙනුවෙන් වන බරපැන සඳහා දායකත්වය

**මෙම වැඩ සටහනට දේශක දීමනා ප්‍රවාහන වියදම්,පිරිකර මිලදී ගැනීම වෙනුවෙන් වන වෙනුවෙන් වන බරපැනට දායක වීමට කැමති සාමාජිකයින් වෙතොත් සභාපති /ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න.**

### චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහනට සහභාගි වන සාමජික පින්වතුන්ට ගිලන් පස -තේ පැන් සැපයීම

**2011-05-15 දින සිට භාවනා වැඩසටහනට සහභාගි වන සාමාජික පින්වතුන්ට ගිලන් පස/ කිරි තේ පැන්, බිස්කට් /කේක් සැපයීමේ කාර්ය අරඹා කර ගෙන යන්නේ මෙත් සවිය කාන්තා කමිටුව විසිනි. මේ දායක වන පින්වතුන්ට සහ ඉටු කරන කාන්තා කමිටු සාමාජිකාවන්ට නිවන්දක්නා ජාති දක්වා ආහාරපාන හිගයක් ඇති නොවී බෙහෙවින් ලැබේවායි පතමු.**

**ඔබටද මේ සඳහා දායක විය හැකිය. මේ සඳහා කැමති සාමාජිකයින් වෙතොත් මෙත් සවිය කාන්තා කමිටුවේ සභාපති නන්දනී වික්‍රමසූරිය මහතමිය වෙති දන්වන්න.**

## වියෝවීම්

ඒ.ඒ.ජී.එෆ්. පෙරේරා මහත්මයා (සාමාජික අංක-01-0228) 2012-06-30 දින අභාවප්‍රාප්ත වූ බව ඔහුගේ බිරිඳ ඉන්ද්‍රා මාලනී පෙරේරා මහත්මිය (සා. අංක 01-0229) දන්වා ඇත. මෙත්සවිය සමාජික සාමාජිකාවන්ගෙ සාතිශය සංවේගය පුද කරන අතර නිවන් මගට යොමු වේවායි පතමු.

යුරේෂා රූපසිංහ මෙනවිය (සාමාජික අංක-03/0602) සුවසෙත කටයුතු වලට සක්‍රියව දායකවූ සාමාජිකාවකි. ඇයගේ පියාගේ අභාවය වෙනුවෙන් මෙත්සවිය සමාජික සාමාජිකාවන්ගෙ සාතිශය සංවේගය පුද කරමි.

**ලිපි සහ තොම්ලයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්**

**වැදගත්** මෙත්සවිය පුවත් සඟරාවේ පළ කිරීම සඳහා එවන සියලු ලිපිද, දාන-ශීල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාර දිය යුතුය. සාමාජිකයන්ගේ දැන්වීම් තොම්ලයේ පළ කරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථානගත විය හැකි බැවින් ඒ පිළිබඳ වග කියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේද වම් පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය.

සංස්කාරක

**මෙත් සවිය දුරකතන අංක**

මෙත්සවිය වැඩසටහන්/තොරතුරු දැනගැනීමට www.methsaviya.lk සහ www.methsaviya.org වෙබ් අඩවි භාවිතා කරන්න. මෙත්සවිය තොරතුරු විමසීමට පරිපාලන නිලධාරි මහතා අමතන්න (011-2505088/ 071-4014467). එම දුරකතන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

මීට අමතරව සම ලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (071-4454411) හා පී. සූරිය ආරච්චි (071-2774727) යන මහතුන්ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා හදිසි තොරතුරු ලබා ගත හැකිය.

සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම දුරකතන අංක (071-4800800) හෝ (0777309385) මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00-10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකතන පණිවිඩ 30ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදු කරන්නේ නම් මැනවි.)

## මරණයෙන් නිදහස් කරගත් ගවයින්ට ආහාර

වැල්ලවත්තේ විජයාරාමාධිපති පූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන් මරණයෙන් නිදහස් කරගත් ගවයින් රැකබලා ගැනීමට කෙනෙකුට බාරදෙන තෙක් බණ මඩුව පිටුපස රඳවා ඇත. මේ ගවයින්ට ආහාර දීම සඳහා තණ මිටියක් ගැනීමට දායකවී කුසල් රැස් කර ගන්න. තණ මිටියක් රු.35. දිනකට ගවයකුට ආහාර දීමට තණ මිටි 2ක් අවශ්‍ය වේ.

මෙත්සවිය සමාජිකාවක් වන මා රජයේ රැකියාවකින් විශ්‍රාම ලබා පූර්ණකාලීන රැකියාවක් බලාපොරොත්තු වෙමි. මාගේ සේවය බලාපොරොත්තු වන කෙනෙක් මෙත්සවිය කාර්යාලයට දැනුම් දෙන්න. සීතා අධිකාරි (සාමාජික අංක- 23-3622) 077-8272908

## ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව

දැනුවත් කිරීමේ 22 වන වැඩසටහන

2012.10.21 දින පෙ.ව.10:00 ට

අරඹනුලබන අතර ඒ සඳහා අයදුම්පත්

2012.08.30 දිනට පෙර භාරදෙන්න.

ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.

**තොම්ලයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම්**

මෙත්සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලි කරු පරිත්‍යාග කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කර ඇත. රෝද පුටු හෝ කිහිලිකරු අවශ්‍ය අය වෙත් නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කළ යුතුයි. මෙම වැඩ සටහන සඳහා රෝද පුටු සහ කිහිලි කරු ලබාදී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙර දැරිව ඉල්ලා සිටිමු.

**සයිට්-ඇන්-ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**

**SIGHT-N-STYLE OPTPMETRISTS**

සියලුම වර්ගයේ ඇස් කන්නාඩි අවශ්‍යතා සඳහා
මෙත් සවිය සාමාජිකා නෙරංජලා කන්නන්ගර මහත්මිය
126 ඕ, හයිලෙවල් පාර, නුගේගොඩ. (අනුලා විදුහල ඉදිරිපිට)
දුරකතන: 011-2854758

**ඡායාරූප**

**සම්බන්ධ ඕනෑම කටයුත්තක් කලාත්මකව කර ගැනීම සඳහා** මෙත්සවිය සාමාජික එස්. පී. පියරත්න **071-327 3858**

**මෙත් සවිය පුස්තකාල පොත් හා සීඩී තැටි** ඔබ පුස්තකාලයෙන් ලබාගත් මාසයක් ඉක්මවූ පොත් හා සී ඩී තැටි කරුණාකර කාර්යාලය වෙත භාර දෙන්න. පුස්තකාල පොත් හා සී ඩී තැටි සඳුදු අඟහරුවාද හැර කාර්යාලය විවෘතව ඇති සතියේ අන් දිනවලදී සාමාජික ඔබහට ලබාගත හැක. පන්ති පැවැත්වෙන ඉරිදු දිනවලදී පමණක් පුස්තකාල පොත් ලබා ගැනීම සඳහා ප.ව 1.45 ට පෙර පැමිණෙන ලෙස දන්වා සිටිමු.

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

(ඡායා පිටපතද් භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

1. සම්පූර්ණ නම ..........................................................................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය............. 3. ජාතික හැඳුනුම්පත් අංකය............................(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය ........................ 5. වයස................. 6. ආගම..................................................

7. ස්ථිර ලිපිනය.............................................................................................................

..........................................................................................................................

විද්‍යුත් තැපෑල(e-mail)........................................ දුරකථන අංක-නිවස-........................ ජංගම.......................

8. දිස්ත්‍රික්කය........................................... 9. විවාහක / අවිවාහක බව...............................................

10. රැකියාව සහ ආයතනයේ නම ..........................................................................................

(ඉංග්‍රිසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) .....................................................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන ...........................................................................................

12. ලිපි එවිය යුතු ලිපිනය.......................................................................................................

..........................................................................................................................

13.1 ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම් 1................................................................................

2.......................................................................................

13.2 ලබා ඇති ඉහලම වෘත්තීය සුදුසුකම් 1..................................................................................

2..........................................................................................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිලිබඳ විස්තර

1 ..................................................................................................................

2 ..................................................................................................................

15. ඔබ ශාරීරික රෝගයකින් (ඇඳුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිලිබඳ විස්තර

..........................................................................................................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිලිබඳ විස්තර.

..........................................................................................................................

18. ඔබට මෙහිදී වැදගත්යයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න

..........................................................................................................................

..........................................................................................................................

මම දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මම පිළිගනිමි.

දිනය..................... අයදුම්කරුගේ අත්සන.................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය.................................

................................ .......... ..............................................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම්


දිනය..................

පුස්තකාල.......................

සැ.යු. ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනිම සඳහා රු.2000/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.1000/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-×2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය තම ආදායම් තහවුරුකළ හැකි ලිපි ලේඛන (උදා:- තම විහාරස්ථානයේ නායක ස්වාමින්වහන්සේගේ නිර්දේශය,) සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුද, අගහරුවාද හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාද, ඉරිද ද ඇතුලුව සතියේ දින 5ක් විවෘතව පවති. අයදුම් කරන සෑමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනිමට හේතුව දැනගැනිමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9×4 ප්‍රමාණයේ තම ලිපිනය ලියු මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් පමණක් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)

ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 6. දුරකථන 011-2505088, 0714-014467. www.methsaviya.lk

# අගෝස්තු මස මාසික වැඩසටහන ධර්ම දේශණය කොටුගොඩ ධම්මාවාස ස්වාමීන් වහන්සේ විසින් සිදු කරන ලදී.





හෙළදිවට බුදුහිමි වැඩමකර වසර 2600 ක් සැපිරීම සමරනු වස් 2012-01-08 දුරුතු පොහෝ දින


# මහියංගන පුදබිමේ අඩි 84 ක් උස බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම

මෙත් සවිය විසින් ආරම්භ කල වගයි





සම්බුද්ධ පරිනිර්වාණය



බුද්ධ පරිනිර්වාණය සිදුවීමට මොහොතකට කලින් බුදුරදුන් වහන්සේගෙන් ධර්ම පැණයක් ඇසීමට පැමිණි සුභද්‍ර පිරිවැජියා අනඳ තෙරුන් වලක්වා ලද්දීත්, තථාගත බුදු ඇසින් දැක මහා කරුණාවෙන් ඔහු හට කරුණු කියාදී ධර්මයෙහි පිහිටුවාලූ සුභද්‍ර පිරිවැජියා ගෞතම බුදුරදුන්ගේ අවසන් ශ්‍රාවකයා බවට පත්වූයේය.

මොහොතකදී අනඳ තෙරුන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "ඇවැත්නි ආනන්ද යන්න කම්පා නොවී පසුතැවිලි නොවී යන්න කුසිනාරාවේ මල්ල රජුන් වෙත ගොස් වාසෙට්ඨ ගොත්‍රිකයිනි! අද රෑ පැසුළුයම තථාගතයන් වහන්සේගේ පිරිනිවීමසිදුවන්නේය, පශ්චිම කාලය වනවිට අපට තථාගතයන්වහන්සේ දක්නට නොලැබුනේයයි පසුව පසුතැවිලි නොවේවායි ඔවුනට කරුණු කියා සිටින්න".

"එසේය! ස්වාමීනි" යයි පිළිවදන් දුන් අනඳ තෙරණුවෝ වහ වහා කුසිනාරාව බලා වැඩ මල්ල රජදරුවන්ට දැන්වූහ. මේ දුක්මුසු පුවත් අසා මල්ල පුත්‍රයෝද, භාර්යාවෝද, යෙහෙලියෝද, දොම්නස් සිතින් යුතුව හඬමින් බිම පෙරළී අත් ගසා ගනිමින් මාගේ සුගතයන් වහන්සේ වහා ලෝකයෙන් අතුරුදහන් වන්නේ යැයි හඬාවැතෙමින් උපවර්තන සල් උයන කරා දිව ආහ. මල්ල රජුන් ප්‍රමුඛ පිරිස ප්‍රථම යාමයෙහිම භාග්‍යවතුන් වහන්සේගේ සිරිපතුල හිසින් වැන්දාහ.

බුදුරදුන්ගේ පිරිනිවීමට ආසන්නවූ වෙසඟ පුර පොහෝ දින, බුදුරදුන්ගේ පිරිනිවීමට ආසන්නවූ වෙසඟ පුර පොහෝ දින, මධ්‍යම රාත්‍රිය ඉක්මවීමට නියමිත හෝරාවේ අවසන් මොහොතේදී ද, මහත් වූ කරුණා පෙරදැරිව "මහණෙනි තමන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු ධර්මය පිළිබඳව යමක් අසාගන්නට ඇතිනම් පසුව පසුතැවිලි නොවී දැන් මගෙන් විමසන්න. මාගේ අන්තිම මොහොත යයි සිතා බුද්ධ ගෞරවයෙන් නොවිමසා සිටින්නට එපා යයි වදාල සේක. ඒ වෙලාවෙහි නිහඬතාවය රැකි භික්ෂූන් දෙස බලා ධර්මය ගැන කිසිදු සැකයක් නැතැයි ප්‍රීතිය පළ කොට "ඇවැත්නි මහණෙනි අවසන් වශයෙන් මම ඔබ අමතමි", "සියල්ල අනිත්‍යයි, වෙනස්වන සුළුය, ඇතිවන සෑමදෙයක්ම නැතිවීම ස්වාභාවික ධර්මතාවයකි. එබැවින් අප්‍රමාදීව තමාට තමා ආලෝකයක් කරගන්න" යන අවසන් බුද්ධ වචනය ශ්‍රී මුඛ පද්මයෙන් දෙසා වදාල සේක.

තුසිතභවනයෙහිදී බුදුවන්නට දෙවියන් ආරාධනා කලදා සිදුහත් බෝසත් උතුමෝ මව් කුස ප්‍රතිසන්ධිය කෙරෙමියි අධිෂ්ඨාන කළ කල්හි බොහෝ ආයු ඇති වරවාරණ නම් දිව්‍ය පුත්‍ර තෙමේ මේ උතුමාගේ ප්‍රසව (බිහිවන) මංගල්‍යට මල් පූජාවක් කරමියි සිතා තමාගේ දිව්‍ය සේනාවද එක්ව මල් ගොතන්නට පටන් ගති. ඒ මල් පූජාව බිහිවන පූජාවටත් නොනිමිය, මහ භිනික්මන් පූජාවටත් නොනිමිය, බෝධිමණ්ඩලයෙහි බුද්ධ පූජාවටත් නොනිමිය, දම්සක් පැවතුම් පූජාවටත් නොනිමිය, දේවාරෝහණ පූජාවටත්(තව්තිසා දෙව්ලොව වැඩ අභිධර්මය දෙසා දඹදිව සංකස්ස පුරයට වැඩීම අරභයා වූ පූජාවටත් )නොනිමිය, ආයු සංස්කාර හරනා දවසටත් (ආයු කාලය හැරදැමීමට තීරණය කිරීම ) නොනිමිය, බුදුන් පරිනිර්වානය කරන මේ පූජාව දක්වාත් අසූ අවුරුද්දක් මුළුල්ලෙහි ගොතාත් ඒ මල් දැල නොනිමියේය. එකල සෙසු දෙවියෝ ඔහු වෙත පැමිණ, වරවාරණ නම් දිව්‍ය පුත්‍රය! ඔබ මල් කාට පූජා කිරීම පිණිස ගොතන්නේද? අද බුදුහු පිරිනිවන් පාති, දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්ම සේනාව රැස්ව පරිනිර්වාණ පූජාකරමින් සිටින්නාහ. ඒ වේලෙහි වරවාරණ දිව්‍ය පුත්‍ර තෙම ලෙහි අත් ගසා ගොතන මල් අතින් හෙලා, මේ කුමන විස්මයක් දැයි කිය කියා නැගී මහත්වූ දුකට පැමිණ, බුදු කෙනෙකුන් ලක්ෂයක් අසංඛ්‍ය කල්පයකිනුත් පහල නොවන්නාහ.

එසේ වූ බුදුරදුන් අදම ඉපිද, අදම වැඩී, අදම මහබිනික්මන් කොට, අදම බුදුව,අදම දහම් දෙසා,සියළු සතුන් සසරින්

මුදා අදම පිරිනිවන් පාවිද? දෙදවසක් ජීවත්වීමටවත්, පින් නැත්තේද?(තුසිත දෙව්ලොව එක් දිනක් මනුලොව වසර 400කි.) මේ මල් ගෙතීමක් නිසා ඒ බුදුන් ගෙන් සතර පද ගාථාවක්වත් අසා නොගතිමියි, මහ හඩින් හඩ හඬා ගොතා නොනිමි මල් දැල ගෙන එක් ලක්ෂ අට සැට දහසක් යොදුන් මහ මෙර මුදුනට නැග "මේ සා ලෝ වැඩ සැලසුවාවූ ඒ උතුමාට මේ නොනිමි මල් දැල පූජාවේවා" යි කියා මල් දැල සක්වලට දමා ගැසීය. එකෙනෙහිම තිස් ලක්ෂ දස දහස් තුන්සිය පනස් යොදුනක් වට ඇති සක්වල ගල වසා ගෙන රවුම් හැඩයගත් වහලක් සේ මල් දැල සිට ගත් හ.

දහසක් සක්වල දෙවියෝ පරිනිර්වාණ පූජාව පවත්වන කල්හි ශාන්ති නායකයානණ්ගේ අවසන් දර්ශනය මෙය කිය කියා මහත්වූ ධර්ම සංවේගයට පැමිණි සත් ලක්ෂයක් මහ තෙර පෙළක්ද, මෙතෙකැයි කියා ගණන් කළ නොහැකි භික්ෂු සංඝයාද, බුදුන් සිසාරා සිටගත් හ. ඒ වේලෙහි තථාගතයානන් වහන්සේ මාගේ දහම් පහන පන් දහසක් අවුරුදු මුළුල්ලේ ලොව මා සිටියා සේම මෝහ අඳුර දුරු කෙරේවායිද, මාගේ ශාරීරික ධාතු තුන් තරමෙකින් බෙදී, මුලු ලෝ විසිර ඒ ඒ ප්‍රජාවෙහි ප්‍රාතිහාර්ය දක්වා ලොවට වැඩක් කෙරේවායි අධිෂ්ඨාන කොට අනාගතයේ සම්බුද්ධ ශාසනය බබළන්නේ සිංහල ද්වීපය තුලයි, කකුසඳ, කෝණාගමන, කාශ්‍යප, බුදුවරයන් වහන්සේලාගේ සර්වඥ ධාතූන් තැන්පත්ව ආරක්ෂාවී පැවතුන ලංකා ද්වීපයේම එක් සේසත් කරන දුටුගැමුණු නම් රජෙක්, ද්‍රෝණයක් පමණ වූ ධාතූන් තැන්පත් කොට ස්වර්ණමාලි නමින් මහා සෑයක් කරවන්නේය, අවුරුදු සියයක් ගතවුනු තැන මියුගු නුවරින් ධර්මාශෝක නමින් රජෙක් බිහිවී බුද්ධ පරිනිර්වානයේදී ද්‍රෝණ අටකට බෙදුනු සර්වඥ ධාතූන් කොටස් හතරකට බෙදා විහාරවල ස්ථාපනය කරවන්නේය, රාම ග්‍රාමයෙහි තැන්පත්ව ඇති ධාතූන් සහිත ස්තූපය බිඳී නාග ලෝකයේ මහා කාල නා රජුන් පිරිවරාගෙන එහි තැන්පත් වන හෙයින් එම ධාතූන් රජු අතට පත් නොකරන්නැයි මොග්ගලී පුත්ත තිස්ස මහ තෙරුන් වහන්සේට පවසන්නැයි වදාළහ.

1. ජයශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව තමන්වහන්සේ විසින් සිඳී කටාරමෙහි පිහිටාවා.

2.ජයශ්‍රී මහා බෝධීන් වහන්සේගේ පත්‍ර හා ගෙඩි වලින් සවණක් ඝන බුදුරැස් විහිදේවා.

3. දක්ෂිණ ශාඛාව සහිත බෝධි පාත්‍රය අනුරපුර මහමෙව්නාවේ ස්ථාපනය කරද්දී ඉහල ආකාශයට පැන නැගී ෂඩ්වර්ණ බුද්ධ රශ්මි මාලා විහිදුවමින් දෙව් බඹුන්ගෙන් පූජෝපහාර ලබත්වා. ඉන් නැගුන ඵල අෂ්ඨය ලංකාද්වීපය තුල රෝපණය කරත්වා.

4. දක්ෂිණ අකු ධාතුව දෙව්ලොවින් වැඩමකොට මිහිඳු මහ රහතන්වහන්සේ විසින් දේවානම් පියතිස්ස රජු ලවා ථූපාරාමය ඉදිකරවා ධාතූන් තැන්පත් කරද්දී බුදුරැස් විහිදේවා.

5. ද්‍රෝණයක් ධාතූන් වහන්සේලා ස්වර්ණමාලී චෛත්‍ය තුල තැන්පත් වෙද්දී තමන් වන්සේ විසින්ම කරඬුවෙන් ඇත් වී ආකාශයට නැගී නිර්මිත බුදුරුවක් මැවී සවණක් ඝන බුද්ධ රශ්මි මාලා පතුරුවමින් යමා මහ පෙළහර පා ධාතු ගර්භයෙහි පිහිටාවායි මෙසේ අධිෂ්ඨාන පහක් කල සේක.

මෙසේ පංච මහා අධිෂ්ඨානය කොට ප්‍රථම යාමයෙහි මල්ල රජුන්ට දහම් දෙසා, මධ්‍යම යාමයෙහි දෙවියන්ට දහම් දෙසා, පශ්චිම යාමයෙහි ශ්‍රාවකයන්ට බණ වදාරා අවවාද දී, අළුයම් රාත්‍රියෙහි ධ්‍යානයෙන් ධ්‍යානයට සමවදිමින් අකාසඤ්ඤායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චායතන, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන, සමාපත්තීන්ට සමවැදී අවසාන වශයෙන් සඤ්ඤාවෙදයිත නිරොධයට සමවැදුනු කල්හි මහත් සේ කම්පාවට පත් අනඳ තෙරණුවෝ "ස්වාමීනි අනුරුද්ධ හිමියනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑහයි සිතමි", "නැත ආනන්ද, උන්වහන්සේ සඤ්ඤාවෙදයිත නිරොධයට සමවැදී ඇත". නැවත මෙසේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සමාපත්ති වලට සමවදී චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගී අළුයම් රාත්‍රියෙහි දස දහස් සක්වල මහ පොලෝ එක් ලක්ෂ විසි දහසක් වාරයෙහි කම්පිත කරවා ඵල සමවතින් නැගී නිරුපාධිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

තථාගත පිරිනිවීමත් සමගම බිහිසුණු ලොමු දැහැ ගැන්වීමක් සහිතව මහ පොළව කම්පා විය. දිව්‍ය ලෝකයන්හි දිව බෙර නාද විය. අහස මද ගිගුරුම් ස්වභාවීය, කිසිවකුටත් හානි නොවන පෘථිවි චලනයක් පමණක් විය.

බුදු රදුන් පිරිනිවීම ඇසූ මහා බ්‍රහ්මයා සියළු සංස්කාර ධර්මයන් නැසෙන සුළුය, ලෝකයේ අසමාන ශාස්තෘවරයා වූ ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේකයි ගාථාපද කීහ.

ඒකාන්තයෙන්ම සියල්ල අනිත්‍යයහ. ඉපදීම නැතිවීම ස්වභාව කොට ඇත. ඉපදීම නැති කිරීම සැපයකියි ශක්‍ර දේවේන්ද්‍රයා ගාථා පද කීහ.

ස්ථිර සිත් ඇති කම්පා නොවන්නාවූ තාදි ගුනැති ශාක්‍ය මුනිද්‍රයන් වහන්සේගේ අශ්වාස ප්‍රශ්වාස නැවතිනි. තෘෂ්ණාවෙන් තොර මුනිද්‍රයන් ශාන්තිය අරභයා කළුරිය කල සේකයි. අනුරුද්ධ හිමියෝ ගාථා පද කීහ.

සියළු උතුම් දැයින් හෙබි සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිරිනිවුනේයයි.අනඳ හිමියෝ ගාථා පද කීහ.

තථාගතයණන් වහන්සේගේ පිරිනිවීමත් සමහම පුහුදුන් භික්ෂූන් ද දෙවියෝ ද හිසෙහි දෑත් බැඳ හඬා වැලපුනෝය.

සියළු දේ අස්ථිරයයි මෙනෙහි කල භික්ෂූන් පමණක් සිහි නුවණින් යුක්තව වැඩ හුන්හ. අහසෙහි පෘතුවි සංඥා දෙවිවරු, භූමාටු දෙවියෝ වහා භගවත් හු පිරිනිවන් පෑහයි, නුවනැති තථාගතයානෝ මෙලොවින් අතුරුදහන් වූහයි. කෙස් කඩා විසිරවමින් දෑත් නළලේ බැඳ පෙරළෙමින් ඉවසාගත නොහැකි සොවින් වේදනාවෙන් හඩා වැටුනෝය. කරුණු පහදා ඔවුන් සනහාලු අනුරුද්ධ, චුන්ද මහරහතන් වහන්සේ අනඳ තෙරුන් අමතා අනන්ද යන්න! මලල රජුන් හට බුදුන් පිරිනිවිනු බව කියා සිටින්නැයි වදාල සේක.

අනඳ තෙරුන් වෙතින් බුදුන් පිරිනිවුනු බව ඇසූ මල්ලවයෝ කල්පාන්ත සුළඟින් ඇද වැටුනු සල්වනයක් සේ හඩා වැටී මූර්ජාවී, රහතුන් වහන්සේගේ අවවාදයෙන් නැගී, සුගතයන් වහන්සේ ඉක්මනින් පිරිනිවන් පා අප දමා ගියෝය. ලෝකයෙන් අතුරුදහන් වූහයි. කෙස් කඩා හිසෙහි අත්බැද, ලෙහි අත්ගසමින් මහත් ශෝකයෙන් හඩා වැටී ශ්‍රී ශරීරයට හත් දවසක් අප්‍රමාණවූ පූජා කරමියි කතිකා කොට ආදාහනයට අවශ්‍ය ලෙසට මුළු නගරය ශ්වේත වර්ණයෙන් සරසා කුසිනාරාවේ නැගෙනහිරින් පිහිටි මකුට බන්ධන පුණ්‍ය භූමියේදී බුද්ධ ශරීරය ආදාහනය කරන්නෙමැයි සිතා කුසිනාරාවේ පුරුෂයන් කැදවා සියලු සුවඳ ද්‍රව්‍යද පංචතුර්යය භාන්ඩද නෙලන ලද කපු පුළුන්ද රැස්කරවාලූහ, අනද හිමි විධානයෙන් චක්‍රවර්ති රජුන්ට කලමනා චාරිත්‍ර කොට අළුත් වස්ත්‍රයෙන් වෙලා නැවත මනා කොට නෙලන ලද කපු පුළුනෙන් වෙලූහ. මේ අකාර පන්සියයක් සළු පට හා පුළුන් පටින්ද බුද්ධ ශරීරය වෙලා සඳුන්තෙල් පිරවූ ඝන රන්මයවූ මහා දෙණකට වඩා, නෘත්‍ය ගීත වාදන මල් සුවඳ විලවුන් ආදියෙන් පුදමින් රෙදිවියන් මණ්ඩල මාල බදිමින් ශෝක හරිතව දවස ගෙවූහ.

"අද බුදුන් සිරුර දැවීම නොකල යුතුය. හෙට අපි සිරුර දවන්නෙමු"යි සිතා අටදෙනෙක්වූ මල්ලවයෝ ස්නනය කොට අළුත් වස්ත්‍ර හැඳ අපි බුදුන්ගෙ සිරුර උසුලම්හයි තැත්කල නමුදු නොහැකි විය."

"ස්වාමීනි අනුරුද්ධ හිමියනි කුමක් නිසා මෙසේ වන්නේද"

"මල්ලවයිනි දෙවියන්ගේ අභිප්‍රාය වූ කලී භාග්‍යවතුන්ගේ සිරුර නෘත්‍ය ගීත සුගන්ධ මල් වලින් සත්කාර කරමින් නගරයෙන් උතුරෙන් උතුරට ගොස් උතුරු දොරින් නගරයට ප්‍රවේශ කොට නගරයේ මැදින් මැදට ගෙන ගොස් නැගෙනහිරින් නික්මී නැගෙනහිරින් පිහිටි මකුට බන්ධන නම් චෛත්‍යස්ථානයෙහි පිහිටි චිතකයෙහි භගවත් සිරුර දවන්නෙමු යි කියාය."

එය එසේම වේවා! පවසා තම රාජ්‍යයෙහි අවසන් හුස්ම හෙලූ මේ ශාක්‍ය පුත්‍රයාගේ ආදාහනය තමන්ට හැකි ඉහලම අයුරින් කරන්නෙමැයි සිතා කුසිනාරාවේ යම්තාක් ගෘහ සන්ධි දනක් පමණ මදාරා මලින් අතුරාලූහ. අනතුරුව දෙවියෝද කුසිනාරාවේ මල්ලයෝද තථාගත ශරීරය සහිත දෙන දිව්‍යමයවුත් මනුෂ්‍යමය වුත් නෘත්‍ය ගීත, සුවඳ මලින් පංච තූර්ය නාදයෙන් පුදමින් උතුරෙන් උතුරට ගෙනගොස් මකුට බන්ධන චෛත්‍ය ස්ථානයෙහි ගෞරවාකාරයෙන් තබාලූහ.

මල්ල රජු අට දෙනෙක් සොළොස් දෙනෙක් දෙතිස් දෙනෙක් බැගින් හිස් සෝදා, නා, අලුත් වස්ත්‍ර හැඳ, සක්විති රජෙකුගේ දේහයට දක්වන සැලකිලි සහිතව සියළු කටයුතු නිමකොට, රාජ්‍ය ගෞරව සහිතව මහා පෙරහැරින් වැඩමවා ගෙන චිත් රත් හඳුන්, සුදු හඳුන්, අගිල්, කොහොඹ, දේවදාර ආදී දුර්ලභ ගණයේ දැව වර්ගයන්ගෙන් නිර්මිත එකසිය වීසිරියන් උස සඳුන් දර සෑයක් බැඳ ආදාහන පූජාව පටන් ගත්හ. එකනෙහිම දනහිසේ සිට ඉහ දක්වාම බුද්ධ භූමිය පරසතු මදාරා මල් වලින් පිරීගියේය. දස දහසක් සක්වල දෙවියෝ රැස්ව අහස් කුස පුරා සිට ගත් හ.

මෙසේ මහත්වූ සෘධිබල ඇති උත්තමයාණන් වහන්සේලා පිරිවරා මහජන සන්නිපාතය මධ්‍යයේ "අපි භාග්‍යවතුන්ගේ සිරුර දවන්නෙමු"යි රනින් කල වටාපතින් චිතිකයට ගිනි දල්වයි. දල්වාගත නොහැකිව "ස්වාමීනි අනුරුද්ධ හිමියනි මීට හේතු ප්‍රත්‍ය කවරේද? "

"මල්ල්වයිනි මහා කාශ්‍යප තෙරුන් වහන්සේ පාවානුවර සිට කුසිනාරාව බලා පන්සියයක් භික්ෂූන් පිරිවරා මග වඩින්නාහ. යම්තාක් භාග්‍යවත් සිරිපතුල් මහා කාශ්‍යප තෙරුන් හිසින් නොවදිත්ද ඒතාක් චිතකය නොදැල්වීවා යනු දෙවියන්ගේ අභිප්‍රාය" යි. "මෙය බුද්ධ අධිෂ්ඨානයෙන් සිදුවූවකි"යි අනුරුධ තෙරුන් වහන්සේගෙන් ඇසූ රජ දරුවෝ ඒ සෘධිමත් තෙරුවන් මෙතනට නොඅවෝය. උන්වහන්සේ නොවැඩියහොත් චිතකය ගිනි නොගනීය, එවැනි සෘධිමතෙක් බලන්නෙමැයි සතුටුව සුවඳ මල් ධජපතාක ගෙන පෙර මගට දිව්වාහුය.

මහා කාශ්‍යප තෙරුන් වහන්සේ කොතැනක වැඩ ඉන්නේද? යත් පෙර සැවැත් නුවර ජේතවනරාමයෙහි බුදුන් වැඩ හුන් කලෙක නුවර එක්තරා උපාසිකාවක් මහා කසුප් තෙරුන් වහන්සේ දැක පූර්ව ජාතියෙහි පටන් උන්වහන්සේට මවු ව සිටිහෙයින් පුත්‍ර ප්‍රේමයෙන් යුතුව දවස දවස දන්දෙන්නාහ. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ බුදුන්ට වඩා සතරඟලකට මිටි මුත් බුදුන් පා වැනිවූ රූ ඇති සේක.

එක් දිනෙක් පිඩු පිණිස හැසිරෙන බුදුන් දැක මහා කසුප් තෙරුන් වහන්සේ යයි බත් සැන්ද බුදුන්ගේ පාත්‍රයට පුදා බුදුන් දන් පිළිගෙන වැඩම කල කල්හි. එතැන මහා කසුප් තෙරුන් වැඩ සිටිනු දුටු ඒ ස්ත්‍රිය මා පුතනුවන් වහන්සේ යයි සිතා අනික් මහණෙක්ට මාගේ බත් සැන්ද පිදුවේය කියා බුදුන් හඹා ගොස් පත්‍රයට අත ලා ඒ බත් සැන්ද දෙවනුව උදුරා ගත්තිය.

ඒ වේලෙහි තථාගතයාණන් වහන්සේ මේ කිමෙක්ද? දිව්‍ය බ්‍රහ්ම නරේන්ද්‍රයන්ද දිව්‍ය භෝජන මා හට පූජා කිරීමට ප්‍රාර්ථනා කරන්නෝය. මේ ස්ත්‍රිය මා හට පූජාකල බත් සැන්ද නැවත රැගෙන ගියාය. පූර්ව චරිත බලා මොනෝමෝ මා දාන පාරමිතා පූරන සමයේදීද මා ගෙන් බත් හුළක් වත් සංග්‍රහයක් නොලද්දීය.

මේ වේලෙහි මහා කසුප් තෙරුන් වහන්සේ බුදුනට මෑ කලාවූ අනාදරය දැක මා තථාගයන හා එක්ව එක නුවර පිඩු සිඟන හෙයින් මේ සා නින්දාවක් වූයේ යයි මහත් සංවේග උපදවා අද පටන් ජීවිතාන්තය දක්වා බුදුන් හා එක ගමක නොසිටිමි අදිටන් කොට ගෙන එදිනම වනයට වැඩ එක්තරා පර්වතයක වසන සේක. මෙතැන් පටන් බුදුහු මා නොදක්නා ලදී. බුදුරදුන් පිරිනිවි සේක් වී නම්, මේ පර්වතය ඉදිරියේ පිහිටි වෘක්ෂයෙහි මල් පරව බිම වැගිරේවා.

මේ සලකුණෙන් බුදුන් පිරිනිවියා හයි දනිමි, අධිෂ්ඨාන කොට එහි වසන සේක. බුදුරදුන්ගේ පරිනිර්වාණයත් සමගම ගස් මල් පරව ගියා සේ දැක, "මාගේ තුන්ලෝ පහන අද නිවිනේ වනැයි දැන උපන් මහත් සංවේග ඇතිව පන්සියයක් පිරිවරා දෙවනුව බුදු කෙනෙකු උපන්නාසේ මහත් පූජාවෙන් වැඩ අවසන් වන්දනාව සිදු කිරීම සඳහ මකුට බන්ධන චෛත්‍යය පිහිටි ආදාහන මළුව කරා වැඩම කොට සිවුරු ඒකාංශ කොට ඇදිළි බැඳ තුන් වාරයක් බුද්ධ ශරීරය තැන්පත් වූ චිතකය ප්‍රදක්ෂිණා කොට ශ්‍රී පාදය දිසාවෙන් ආකාශයට පැන නැගී බුදුන් වැද හොත් සේක.

එ කෙනෙහිම දිය පළා පැන නැගී මහා පියුම් දෙකක් සේ ස්වාමි දරුවානන්ගේ ශ්‍රී පාද පත්මයන් පන්සියයක්, පුළුන් පට පන්සියයක්, සළුපට රන්දෙණ, දර සෑය දෙබෑකොට ගෙනු වළා ගැබින් පෙනී ගිය පුන් සඳ මඬලක් සේ පිටතට පැමිණ දිව්‍ය මනුෂ්‍යයන් බල බලා සිටියදීම කාශ්‍යප මහා තෙරුන් වහන්සේ ගේ නළල් තල මත්තෙහි පිහිටියේය. ඒ වේලෙහි දිව්‍ය මනුෂ්‍යයෝ බුදුන් පිරිනිවිනු මොහොතටත් වඩා බොහෝ සංවේගයට පත් විය. එ කල මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ රත් පියුම් පෙති සහල වන් අතුල් දෙකින් බුදුන්ගේ ශ්‍රී පතුල් අල්ලා ගෙන වැඳ සංවේගයට පැමිණි සේක. මහ තෙරුන් වහන්සේ වැඳි පසු ශ්‍රී පාද පත්මයන් වලා ගැබකින් සැඟවුනු පුන් සඳක් සේ නැවත රන් දෙණ තුලට වන්හ. එ සැනෙහිම දර සෑය තෙමෙම ගිනි ගත්හ. ඒ ආශ්චර් යය දුටු මනුෂ්‍යයෝද දෙවියෝද සාදුකාර දුන්හ.

ආයුෂ වැඩි සර්වඥයන් වහන්සේලාගේ ආදාහනයේදී ශාරීරික ධාතු නොවිසිර එක රන් පිළිමයක් සේ තිබේ. ආයුෂ අඩු සර්වඥයන් වහන්සේලාගේ ධාතු විසිරී යන්නේය.

ඉක්බිති චිතකයේ ගිනි නිවී යද්දී ආකාශයෙන් හා පොළොවින් ජල ධාරාවෝ දෙකක් දිව අවුදින් ගිනි නිවුවාහුය. එකල මල්ල රජ දරුවෝ මහත් පූජාවෙන් ආදාහන කෘත්‍යය කොට සියළු සුවඳ පැනින් හගවත්හුගේ චිතකය නිවූහ.

ආයුෂ වැඩි සර්වඥයන් වහන්සේලාගේ ආදාහනයේදී ශාරීරික ධාතු නොවිසිර එක රන් පිළිමයක් සේ තිබේ. ආයුෂ අඩු සර්වඥයන් වහන්සේලාගේ ධාතු විසිරී යන්නේය.

ඉක්බිති චිතකයේ ගිනි නිවී යද්දී ආකාශයෙන් හා පොළොවින් ජල ධාරාවෝ දෙකක් දිව අවුදින් ගිනි නිවුවාහුය. එකල මල්ල රජ දරුවෝ මහත් පූජාවෙන් ආදාහන කෘත්‍යය කොට සියළු සුවඳ පැනින් හගවත්හුගේ චිතකය නිවූහ.

දස දහසක් ලෝක ධාතුන්හි දෙවිවරුන් බලා සිටියදී රන් දෙන විවර කල මල්ල රජ දරුවෝද, විශාල පිරිසක්වූ දෙව් මිනිසුන් ද හඬා වැටුනාහ. බුද්ධ ශරීරය පොරවා තිබූ වස්ත්‍ර යුග පන්සියයෙන් සියල්ලට ඇතුලතින් හා පිටතින් තිබූ වස්ත්‍ර දෙක පමණක් දැවී තිබුනි. දැල්වුනාවූ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයේ සිවිය, සම, මස්, නහර, සඳ මිදුළු චේද ඒවායේ අළුද දක්නට නොලැබිනි. අස්ථි ධාතු පමණක් ඉතිරිවිය.

මාගේ ස්වාමිවූ බුදුරජාණන් වහන්සේගේ සතර දන්ත ධාතුය. ලලාට ධාතු දෙකය. වම් හා දකුණු අකු ධාතු යුගලයන්ය. ශ්‍රීවා ධාතුවය. මේ ධාතු සත තිබියදී අවශේෂ ධාතු මුං බියලි සාය, කඩ සාලැටය, අබ ඇට සාය, යන තුන් තරමෙක විසිර මුතු දෙණක් සේ විය. එදා දෙසතියක් මහා පුරිස ලකුණින් හෙබියාවූ තථාගත බුද්ධ කාය අද අප දකින්නෙ මෙවන් රන් පැහැති ධාතුබවට පත්වූ අකාරයෙන් දැයි කියමින් රජදරුවෝද හඬා වැටුනහ. ඉක්බිතිව මලල රජුහු තමන්ගේ නුවර මැද සන්ථාගාරය සතර වැදැරුම් සුවඳින් සුවඳ ගන්වා ලදපස් මල් ඉස රන් තරු රිදී තරුයෙන් විසිතුරුව වියන් බැඳ, මල් දම්, රුවන් දම් එල්වා වටතිර ඇඳ සන්ථාගාරයෙහි පටන් බුදුන් ආදාහනය කල මකුට බන්ධන චෛත්‍යය දක්වා දෙපස තිර ඇඳ අහස් වියන් බැඳ ධජ පාතාක නංවා රන් කලස තනා රනින් කල පහන් දල්වා අලංකාර වූ විට රන් දෙන වටා සුවඳ මලින් පුදා මහත්වූ උත්සව කෙළියෙන් අතුළු නුවරට වැද සන්ථාගාර මධ්‍යයෙහි සත් රුවන් මංඩපයක් මතුයෙහි රන් දෙනින් ධාතු වඩමවා සේසත් නහා කඩුගත් යෝධයන් පදනම වටා උරෙන් උර සිටුවා, රථ සෙනඟ සිටුවා, අස් පෙළක් සිටුවා, ඉන් පිට දුනුගත් භේවායන් සිටුවා ධාතුන් සතුරන්ගෙන් රැකවල් කලහ.

එකල රජගහනුවර අජාසත් රජ හු මේ පුවත් ඇසූ සැනින් සෝකාග්නියෙන් මියයන්නේ යයි සිතා ඔරු හතක ගිතෙල් පුරවා, තවෙකක ගෝ ශීර්ෂද සඳුන් කල්කඳ පුරවා, උයන් දෙර තබා, රජතුමනි ලෝක නායක ගෞතම බුදුහු පිරිනිවන්

බවය මෙයින් පසු සිහි එළවාගත් අජාසත් හු උමතු පුරුෂයෙකුසේ ලෙහි අතගසමින් මහ වීදිය මැදට පැන වේළුවනාරාමය කරා දිව ගොස් මාගේ බුදුන් මහපොළොව හඬවා පිලිගත් වෙහෙර මේ යයි හඬ හඬා, ගඳකිළියට වැද එතනෙහිද හඬා ඉන් නැගිට ධම් ශාලාවෙහි බුදුන් වැඩහුන් බුද්ධාසනය බල බලා හඬමින් එතැනදී ගථා සැටකින් බුදු ගුණ කියකියා මගේ හැඬීමෙන් ඵලක් නැත. බුදුන්ගේ ධාතු ගෙන බුදුන් දුටුවාසේ පුදම් කියා. භාග්‍යවතුන් වහන්සේ මෙන්ම මාද ක්ෂත්‍රියෙක්මි උන්වහන්සේගේ ශාරීරික ධාතු ලැබීමට මමද සුදුසු වෙමි. වහා මලල රජුන් වෙත දූතයන් යැවීය. ඉක්බිති විසල් පුර ලිච්ඡාවීහුද කපිල වස්තුවේ ශාක්‍යයෝද, අල්ලකප්පවාසී බුලිහුද, රාම ග්‍රාමයේ කෝලියෝද, වෙඨදීපක බමුනද, පාවානුවර වැසි මල්ලයෝද, භාග්‍යවතුන්ගේ ශාරීරික ධාතු ලැබීමට අපිද සුදුස්සෝ වෙමු. අපිද ධාතු නිදන් කොට ථූපයක් බැද ඊට ගරු කිරීමට කැමැත්තෙමුයි. කියමින් සත් රජයක සත් සෙනහක් හා රජදරුවෝ කුසිනාරාව සිසාරා සිට ගත් හ.

භාග්‍යවතුන් වහන්සේ අපගේ ග්‍රාමයෙහි පිරිනිවන් පෑ සේක. අපගේ නුවර උපන්නාවූ ධාතු රත්නය අපටම හිමිය. එබැවින් තථගතයාණන් වහන්සේගේ ශාරීරික ධාතුවලින් කොටසක් නොදෙමුයි සංසයාට හා ජන සමූහයට කියා සිටියහ. එසේ නම් යුධ වදින්නෙමුයි. සෙසු රජ දරුවෝ කියා සිටියහ.

ඒවේලෙහි දඹදිව සියළු රජුන්ට ශිල්පයදුන් රාජගුරු ද්‍රෝණ බමුණා හැම රජුන් සන්සිඳවා, පින්වත්නි! මගේ එක වදනක් අසත්වා, සාක්‍යසිංහවු තථාගතයාණන් වහන්සේ ක්ෂාන්තිවාදි වූ සේක. උන්වහන්සේගේ බුද්ධ ශරීරය නිමිති කොට ආයුධ සම්ප්‍රහාරයක් වන්නේ නම් ( සංග්‍රාමයක්) යහපත් නොවන්නේය. එසේ නොවී ධාතුන් අට කොටසකට බෙදනනෙමැයි පවසා නැලි දෙක බැගින් ධාතු අට කොටසකට බෙදා දකුණු දළදා වහන්සේ රජ දරුවන් කථා කරද්දී සොරා අරුගෙන තම හිස කෙස් යට සඟවා ගත් හ. අනෙක් ධාතුවක් තම සළු පිළි අතර සඟවා ගත් හ. තෙවැන්නද පාද මුවාවෙන් සඟවා ගත් හ.

මේ වෙලෙහි සක් දෙව් රජ සියළු සතුනට ධම්ය දෙසුවාවූ මුඛයෙහි ජාත දන්ත ධාතුවට උපහාර කිරීමට මේ බමුනා සුදුසු නොවේ යයි සිතා සූක්ෂම වූ අතක් මවා ඔහු හිසින් සොරා හැරගෙන රුවන් කරඬුවකට වඩා ශක්‍ර පුරයට ගෙන ගොස් සිළුමිණි සෑයට වඩමවා අද දක්වා පූජා කෙරෙයි.සළුපිළි අතරෙහි සඟවා තිබූ ධාතුව, පෙර බුදුවරයන් අතින් විවරන ලද ගන්ධාර දේශයෙන් පැමිණි පින්වත් ශ්‍රාවකයෙකු විසින් රැගෙන ගිය බවද සඳහන්ය. පාද මුවාවෙන් සඟවා ගත් ධාතුන් දුටු ජයසේන නම් නා රජු පොළොව ඇතුලතින් පැමිණ නාලොවට ගෙන ගොස් එය මැණික් මන්දිරයක වඩා හිඳුවා, වසර 200ක කාලයක් වැඳුම් පිදුම් කලහ. අද එය සෝමාවතී චෛත්‍යයෙහි වැඩ හිඳින්නහ. සාරිපුත්ත හිමිගේ ඛේම නම් සෘධිමතුන් වහන්සේ විසින් රැගෙන ගිය ධාතුන් වහන්සේ මහනුවර දළදා මාලිගාවේ වැඩ හිඳින අතර, නාලොව මහ කෙළ නා රජුන් විසින් පුදනු ලැබූ ද්‍රෝණයක් ධාතුන් වහන්සේලා ෂඩ් අභිඥාලාභී සෝනුත්තර නම් සෘධිමතුන් වහන්සේ විසින් මහ කෙළ නා රජු සංඥාවෙන් ධාතු නොදෙමියි පවසා ධාතු කරඬුව ගිල සැඟවී සිටි වාසුල දත්ත නා රජුන්ට නොදැනෙන සේ සියුම් අතක් මවා වාසුල දත්තයන් ගිලගෙන සිටි ධාතුන් රැගෙන ගොස් සවණීමාලි චෛත්‍යයේ නිදන් කල බවය. දකුණු අකු ධාතුව ථූපාරාම චෛත්‍යයේ වැඩ හිඳින්නාහ.

ලිච්ච්වී රජු හට ලැබුනු ලලාඨ ධාතුන් වහන්සේ කාවන්තිස්ස රජ විසින් කරවන ලද සෙරුවිල සෑයේ බුද්ධ රූපයක් තුල නිධන්ගතව ඇත. බුදුරජාණන් වහන්සේගේ පාත්‍රා ධාතුව පිරවූ ධාතුන් වහන්සේලා ලංකාවේ යොදුනක් යොදුනක් පසා චෛත්‍ය ස්ථානවල වැඩ හිඳින්නේය.

අජාසත් රජ හු තම කොටස ගෙන කුසිනාරා නුවරටත්, රජගහනුවරටත්, අතර විසිපස් යොදුන් මාර්ගය ගඳින් මලින් සරසා බුදුන්ගේ ධාතු සත් රුවන් රථයකට වඩා මනුෂ්‍යයන් රැස් කරවා මහත්වූ පූජා පවත්වා රජගහනුවර මහත්වූ දාගැබක් කරවා පූජා සත්කාර කලාහුය.

මෙකල ධාතු සොයා ආ පිප්පිළි වනයේ පිප්පිළි මෝලිය දෙනුවර රජදරුවෝ භාග්‍යවතුන් වහන්සේ ධාතු නොලදින්' මේ ම අපට ධාතු යයි ආදාහන භූමියෙහි රැස්කොට තිබූ අඟුරු රන් කරඬුයෙන් වඩා මහා පෙරෙහරින් ගෙනෙගොස් අඩහර ථූපය කරවා තම ශක්ති පමණින් පූජා කලාහුය.

ද්‍රොණ බමුනා ධාතු බෙදා අවසාන හිස අත ගා බලා තමා සතු ධාතු නොදැක ශෝක කොට මටත් වඩා සොරෙක් අරගතැයි සිතා ලැජ්ජාවට පත්ව ධාතු බෙදූ ස්වර්ණමය නැළිය රජදරුවන්ට කියා ඉල්වා කුම්භ නම් ථූපය බඳවා පූජා කාලාහුය.

පුරුෂෝත්තම බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු ද්‍රෝණ හතක් දඹදිව වැස්සෝ පුදති. එක් ධාතු ද්‍රෝණයක් රාම ග්‍රාමයෙහි නාග රාජයෝ පුදති. එක් දලදාවක් දෙවියන් විසින් පුදනලදි. එකක් ගන්ධාර පුරයෙහි පුදනු ලබන්නේය. දළදාවේ තේජසින් ලැබූ පුද පූජාවන්ගෙන් මේ ලෝ තලය අලංකාර කරන ලදී.

සත්කාර කරනු ලබන්නන් විසින් මනාකොට සත්කාර කරන ලද්දාවූ ශාන්ති නායකාණන්ගේ මේ ශාරීරික ධාතුන් වහන්සේලා මෙලෙසින් නාගේන්ද්‍ර දේවේන්ද්‍ර නරේන්ද්‍රයන් විසින් පුදන ලද්දීය. ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් විසින් පුදන ලදී. ඇඳිළි බැඳ එය නමදිමි. ඒකාන්තයෙන් කල්ප සියයකිනුදු බුදුවරු දුර්ලභ වෙති. පහල නොවෙති.

-ගනේගම ඥානාරාම හිමිගේ ලිපියක් ඇසුරිනි.

## ප්‍රේත ලෝකය

ප්‍රේත යන වචනය සෑදී ඇත්තේ ප්‍ර (පිටත්ව ගිය /ඉවත්ව ගිය ) + ඉත (මෙලොවින් ) එකතු වීමෙනි. මෙලොවින් පිටත්ව ගිය /ඉවත්ව ගිය යන අදහසින් පරලෝ සැපත්වන සියල්ලෝම ප්‍රේත ගණයට ගැණෙති. ( පේතං පර ලෝක ගතෝ ) එසේම සතර අපායෙන් එකක් වන ප්‍රේත ලෝකයෙහි උපන් අයද ප්‍රේත යනුවෙන් හඳුන්වති.

තමන් කරන ලද පාපකර්ම වල විපාක ලෙසින් බත් පැන්නොමැතිව ආහාර සොයමින් ඔබ මොබ හැසිරෙමින් මහ දුක් විඳින සත්ව කොට්ඨාශය ප්‍රේත වශයෙන් දක්වා ඇත.

තිරෝකුඩ්ඩ සූත්‍රයෙහි එන ලෙසින් බිම්බිසාර රජතුමාගේ ඥාතීන් පිරිසක් ප්‍රේතාත්මවල දුක් විඳ පසුව පින් අනුමෝදන්ව සුවපත් වූ ආකාරය දක්වා ඇත.

ප්‍රේත වර්ග සතරකි.

1. **නිජ්ඣාම තණ්හිකා** - බිලය සහිත ගසක ඇතුලත ඇවිලගත් ගිනි කඳක් මෙන් කර්මයෙන් හටගත් උණුසුමින් දැවෙන ප්‍රේතයෝ
2. **ඛුප්පිපාසිකා** - සෙම්සොටු පමණක් වත් ආහාරයක් නොලැබූ කල්පගණන් සා පිපාසා දෙකෙන් පෙළෙමින් දුක් විඳින ප්‍රේතයෝ
3. **පංසුපිසාචිකා** - කසළ ගොඩආදී අපවිත්‍ර තැන්හි ආහාර සොයා හැසිරෙමින් දුක් විඳින ප්‍රේතයෝ
4. **පරදත්තුපජීවී** - අනුන් දෙන පිනෙන් ජීවත්වන ප්‍රේතයෝ

ප්‍රේතාත්ම ලැබීමට හේතු වන කාරණා

1. සඟසතු දේ අයථා ලෙස පරිභෝග කිරීම, විනාශ කිරීම,
2. සත්ත්ව ඝාතනය, සත්ත්ව හිංසනය
3. මුසාවාදය ( කට සවර කර නොගැනීම )
4 ලෝභය ( ලෝභාදිකේන පාපේන පේත ලෝකේසු ජායරේ )
5. ඊර්ෂ්‍යාව හා වෛරය
6. කාමමිථ්‍යාචාරය (කයින් අසංවරවීම )

සද්ධම්මෝපයනය නම් ධර්ම ග්‍රන්ථයෙහි ප්‍රේතයින්ගේ ස්වරූපය දක්වා ඇති අයුරු

යම් කෙනෙක් තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් අනුන්ට බෙදා නොදෙන්නේ ද, ඊර්ෂ්‍යා බහුල වේ ද, තමන්ට ඇති වස්තුව සඟවන සුලු වේ ද ඔව්හු ප්‍රේතයින් අතර උපදිති.

සා පවසින් පීඩිතවූ කෘෂවූ මහත් ශරීර ඇති ප්‍රේතයෝ මහා ඇට සැකිලි ඇත්තාහුය.

බඩ සම පිටකටුයෙහි ඇලී ගියේ ය. නොපැසී වියලී ගිය ලබු ගෙඩියක මෙන් ඇකිලුණු සමින් යුක්තය.

ඇට සම් නහර ඉතිරිවූ සිරුරය. ඇස් හා කොපුල් ඇතුලට කිඳා ගොස් ඇත. අවුල් වූ හිස කෙස් ය. අඳුරු වූ මුහුණය. කිසිල්ලෙහි හා සිරුරෙහි දික් වූ රෝමය. සිරුර රළු සහිතය. මුලු ලොව විරූප බව එක් තැනක රැස්වූවාක් වැන්න. නිරුවත් බවින් යුක්තය. බත් ටිකක් හෝ පැන් පොදක් හෝ නොලැබ බොහෝ සෙයින් විඩාවට පත්වූවාහුය. කෑම පිළිබඳ දැඩි වූ ආශාවකින් පෙළෙති. කෑම ඇතැයි සිතා එක් තැනකට රැස්වූ පසු එකා පිට එකා එල්ලෙති. ශරීර අප්‍රාණිකව ඇති බැවින් නැවත රූරා වැටෙති.

කෑම දෙතැයි සිතා අත් දිගු කොට ඔබ මොබ දුවති. වෙහෙසව මුලින් කපන ලද තල් ගසක් මෙන් ඇද වැටෙති. ඇතැම් ප්‍රේතයකුගේ රෝමකූපයෙන් නැගෙන ගිනි ජාලාව තම මුලු සිරුරම දවාලයි.

මුවින් කාරා දැමූ සෙමෙන් ද, වැදූවන්ගේ බඩවැල් කැබලි වලින්ද ලෝ වැසියන් ගේ සිරුරින් බැහැර වූ අසූචි යන කුනු අනුභව කරනු පිණිස ප්‍රේතයො යොදුන් ගණන් දුව යති. ඔවුනොවුන් උදුරා ගත්තත් කිසිවක් නොලබති.

ප්‍රේතයන්ට සෙවන අව්ව වෙයි.ඔවුන් යන තැන මහ විල් පොකුණු හිස් වෙයි. ස්වභාවයෙන් සිසිල් සුළඟ උණු වෙයි. සිසිල් සඳරැස් ගිනි දැල් මෙන් සිරුර දවයි. යමක් මැනවයි සම්මතද ඒ සියල්ල විපර්යාසව පැමිණෙයි. මේ ආදී වශයෙන් ප්‍රෙත ලෝකයේ කෙළවරක් නැති දුක් රැසක් ඇත.

මේ ප්‍රේතයන්ට අමතරව කථාවස්තුප්‍රකරණයේ ප්‍රේතයන් හා සමාන කාලකඤ්ජික නම් අසුර නිකායක් ගැන සඳහන් වේ.

එහි ප්‍රේතයන් තුන්ගව් පමණ අත්බැව් වෙයි. ලේ මස් නැතිවන බැවින් පරඬලා පත් වැන්න. කකුළුවන්ගේ ඇස් සෙයින් ඇස් නික්ම මුදුනෙහි සිටී. එයින් ගොදුරු ගන්නා කල නැඹුරුව මිස ගත නොහැකියි.



# මාසික වැඩසටහන ධර්ම දේශණය විශේෂ අවස්ථා







## 2012 අප්‍රේල් 01 ඉරු දින - ත්‍රෛමාසිකදාන ශීල භාවනා වැඩසටහන පිලිකුත්තුව ඓතිහාසික ගල්ලෙන් ආරණ්‍යයේදී සිදු කළ අතර එහි විශේෂ අවස්ථා

ඓතිහාසික පිලිකුත්තුව රජමහ විහාරයේ දහම් පාසල නැවත ආරම්භ කිරීමටඅවශ්‍ය මේස සහ බංකු යුගල 5ක් මෙත් සවිය සාමාජික-සාමාජිකාවන්ගේ දායකත්වයෙන් පූජා කරන ලදී. දායකවූ සාමාජික-සාමාජිකාවන්ටත්, මෙම කාර්යයට හත් අයුරින් උදව් කල සියලු දෙනාටත්, සහභාගි වූ සියලු දෙනාටත් පින් අනුමෝදන් කරමු.